# 2023/08/10 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/08/10 වන දින පෙ.ව.09.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරි ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරි ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා, කාර්මික නිලධාරි ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, සංවර්ධන නිලධාරි ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරි කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා හා විෂය නිලධාරි පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/07/27 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කමිටු සාමාජිකයින් ඒකමතිකව අනුමත කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

a. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛන

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | ඩී.එම්.ආර්.යූ.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා 2023 ජූලි මස 16 සිට 31 දක්වා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. | 96,974.00 | නිර්දේශ කරන ලදී. |
| 02. | ආර්.එම්.මදූසිකා රත්නායක මිය, සංවර්ධන නිලධාරි, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023 කාර්ය සාධන තරඟාවලිය දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා පළාත් පාලන ශ්‍රවණාගාරයට යාම වෙනුවෙන් 2023/07/25 දින ගමන් වියදම් ගෙවීම. | 980.00 | නිර්දේශ කරන ලදී. |
| 03. | පී.වාසනා නිල්මිණී මිය, සවර්ධන නිලධාරි, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානයට යාම වෙනුවෙන් 2023/08/02 දින ගමන් වියදම් ගෙවීම. | 1,220.00 | නිර්දේශ කරන ලදී. |
| 04. | වයි.එම්.නුවන් හර්ෂණ මයා, රියදුරු, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 252-6368 කැබ් රථයේ අලුත්වැඩියාව සිදු කිරීම සඳහා යාම වෙනුවෙන් 2023/07/28,31 දින ගමන් වියදම් ගෙවීම. | 1,960.00 | නිර්දේශ කරන ලදී. |
| 05. | වයි.එම්.නුවන් හර්ෂණ මයා, රියදුරු, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 252-6368 කැබ් රථයේ අලුත්වැඩියාව සිදු කිරීම සඳහා යාම වෙනුවෙන් 2023/08/01,02,03,04,05 දින ගමන් වියදම් ගෙවීම. | 4,900.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | එම්.එස්.කේ.මහානායක මයා, ආදායම් පරීක්ෂක - 2023 ජූනි මස පරිවර්තික දීමනා ගෙවීම. | 2,500.00 | නිර්දේශ කරන ලදී. |
| 07. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඌව පළාත් සභාව - පොදු 35(96 රීතිය) මුද්‍රණය කරගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 15,000.00 | නිර්දේශ කරන ලදී. |
| 08. | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු ඉටු කිරීම වෙනුවෙන් 2023 ජූනි මස ක්ෂේත්‍ර රාජකාරි ගෙවීම් කිරීම. | 1,600.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 09. | කළමනාකරු, රත්න සුපර් සිටි, නුවර පාර, මීගහකිවුල - තල්දෙන අරුකුඹුර ජල යෝජනා ක්‍රමයේ මීගස්පිටියේ සවි කර තිබෙන පොදු ජල නළේ අධාරක කණුව හා බෙසම විනාශයට පත්වීම වැළැක්වීමට සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.(සිමෙන්ති, බිල්පත් අංකය- 0651) | 2,035.00 | නිර්දේශ කරන ලදී. |
| 10. | ඩී.එම්.ධනපාල මයා, පුබුදු කොන්ක්‍රීට් ඇන්ඩ් හාඩ්වෙයාර්, කෙසෙල්වත්ත, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ජල පිරිපහදු ඒකකයට හා CCTV කැමරාව සවි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම් පියවීම.(wiring එකට අවශ්‍ය ද්‍රව්‍ය) | 31,485.00 | නිර්දේශ කරන ලදී. |
| 11. | කළමනාකරු, රත්න සුපර් සිටි, නුවර පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කෝමාරික ජල යෝජනා ක්‍රමයේ වැල් පෙට්ටි 02 සඳහා ඉබි යතුරු මිළදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් පියවීම.(බිල්පත් අකය-0645) | 1,650.00 | නිර්දේශ කරන ලදී. |
| 12. | කළමනාකරු, ඉසුරු ඉලෙක්ට්‍රිකල්ස්, වේරගන්තොට පාර, මහියංගණය - මීගහකිවුල ජල පොම්පාගාරයේ සවිකර තිබෙන ප්‍රධාන විදුලි සැපයුමට යොදා ඇති වයර් පිලිස්සීමෙන් නැවත එය සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම් සඳහා මිළ ගණන් පියවීම.(වයර්, ලග්,බිල්පත් අංකය-0364) | 4,060.00 | නිර්දේශ කරන ලදී. |
| 13. | විගණකාධිපති, ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ අංක 7040064 දරණ ගිණුමට බැර - 2022 වර්ෂයට අදාල මුල්‍ය ප්‍රකාශන විගණනය කිරීම වෙනුවෙන් ජාතික විගණන කාර්යාලය වෙත ගෙවිය යුතු විගණන ගාස්තුව ගෙවීම. | 61,686.00 | නිර්දේශ කරන ලදී. |
| 14. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් - 2023 ජනවාරි,පෙබරවාරි,මාර්තු,අප්‍රේල්,මැයි,ජූනි හා ජූලි මස වල කාර්ය මණ්ඩල නිලධාරින්ගේ අය කරන ලද මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවීම. | 7,900.00 | නිර්දේශ කරන ලදී. |
| 15. | ආර්.එම්.ලලිත් කුමාර මයා, රියදුරු, ඌව කළමනාකරණ සංවර්ධන ආයතනය, පැල්ගහතැන්න - ඔහිය ආයතනය සඳහා රාජකාරි කටයුත්තක් සඳහා යාම වෙනුවෙන් 2023/07/22 දින ගමන් වියදම් ගෙවීම. | 700.00 | නිර්දේශ කරන ලදී. |
| 16. | ආර්.එම්.ලලිත් කුමාර මයා, රියදුරු, ඌව කළමනාකරණ සංවර්ධන ආයතනය, පැල්ගහතැන්න - ඔහිය ආයතනය සඳහා රාජකාරි කටයුත්තක් සඳහා යාම වෙනුවෙන් 2023/07/22 දින අතිකාල දීමනා ගෙවීම. | 1,624.00 | නිර්දේශ කරන ලදී. |
| 17. | ආර්.එම්.රුක්මන් පුෂ්පමාල් මයා, ගෝල්ඩන් ටාර්ගට් හෝටලය, 14 කණුව, මීගහකිවුල - දිවා ආහාර ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. තලාවතැන්න කසළ ඉඩම මැනීම සඳහා පැමිණි නිලධාරීන්ට ලබා දීම. | 2,450.00 | නිර්දේශ කරන ලදී. |
| 18. | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - නිට්ටඹුව උසාවියට යැම සඳහා භාවිතා කරන ලද රථයට ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් අතින් දරන ලද මුදල් පියවීම. | 22,950.00 | නිර්දේශ කරන ලදී. |
| 19. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරි - 2023/08/07 දින PF-5485 කැබ් රථය ලියාපදිංචි සහතිකය නිදහස් කර ගැනීම සඳහා මෝසමක් ඉදිරිපත් කිරීමට නීතිඥ ගාස්තු ගෙවීම වෙනුවෙන් අතින් දරණ මුදල් පියවීම. | 5,000.00 | නිර්දේශ කරන ලදී. |
| 20. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරි - UPPF 5485 කැබ් රථයේ නඩු කටයුත්තක් සඳහා අත්තනගල්ල ශ්‍රේෂ්ඨාධිකරණයට 2023/05/15 දින යැම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 1,930.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 21. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරී - වෙබ් අඩවි නිර්මාණ පුහුණු වැඩසටහන සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට 2023/06/21 දින යැම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 980.00 | නිර්දේශ කරන ලදී. |
| 22. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරී - වාහාන විෂය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට 2023/07/18 දින යැම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 980.00 | නිර්දේශ කරන ලදී. |
| 23. | පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ, පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය, කහගොල්ල, බණ්ඩාරවෙල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු ZA 5003, 252-6368, LL 7774 යන වාහන පරීක්ෂා කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 3,620.00 | නිර්දේශ කරන ලදී. |
| 24. | පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ, පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය, කහගොල්ල, බණ්ඩාරවෙල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 252-6368 හා YTS 6208 ගල්රෝලෙහි මිල සාධාරණ වාර්තා ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 4,192.22 | නිර්දේශ කරන ලදී. |
| 25. | ඇවෝන්ස්මාර්ට් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ්, NO.33, Level 15 B Floor, Parkland Building, Park street, Colombo-02 - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු ටොන් 08 ගල් රෝලයෙහි වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම. | 176,121.64 | නිර්දේශ කරන ලදී. |
| 26. | කළමනාකරු, ලක්සිත මෝටර්ස්, මහියංගණ පාර, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 252-6368 කැබ් රථයේ අළුත්වැඩියාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 155,800.00 | නිර්දේශ කරන ලදී. |

b. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

c. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද සේවකයින්, ආදේශක පදනමින් බඳවා ගන්නා ලද සේවකයින් හා අනියම් සේවකයින් සඳහා 2023 ජුලි මස වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

II. මීගහකිවුල, කලුගහකඳුර හා පිටමාරුව යන මහජන පුස්තකාල තුනෙහි නාම පුවරු සකස් කර ගැනීම සඳහා සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

III. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කෝමාරික ජල යෝජනා ක්‍රමයේ ජල උල්පත ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය බට මිලදී ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

IV. මීගහකිවුල ප්‍රාදේශීය සභවේ 2023 ජුනි මස මාසික ආදායම් සාරාංශය සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

V. මීගහකිවුල ප්‍රාදේශීය සභවේ 2023 ජුනි මස මාසික ගෙවීම් සාරාංශය සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තුති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.10.30ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) -
2) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
4) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -
5) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
6) ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
7) කේ.තරිඳු දර්ශන ප්‍රියකෑළුම් මහතා (කමිටු සාමාජික) -